# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2019

# Primary piriven first End Test – 2019

## 5 වසර – Grade 5

**සිංහල - I** කාලය : පැය 03 යි

**Sinhala –I** Time : Three hours

සැ.යු. ★ මෙම පත්‍රය කොටස් <u>දෙකකින්</u> සමන්විත වේ.
★ <u>සියලුම</u> ප්‍රශ්නවලට උත්තර සපයන්න.

---

I කොටස

★ මෙම කොටසට නියමිත ලකුණු ගණන 40 කි.

★ <u>නිවැරදි හෝ වඩාත් ගැළපෙන</u> පිළිතුර තෝරන්න. ඒ සඳහා ඔබට සපයා ඇති උත්තර පත්‍රයේ උපදෙස් වලට අනුකූලව පිළිතුරු සපයන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

01) ඔහු මිතුරාට පැවසුවේ තමන්ට වඳින්න ගිය දේවාලේ <u>හිසේ කඩා වැටුණා වගේ</u> වැඩක් සිදු වූ බවය.
1. දේවාලය තමන්ට පිහිට වූ බවය. 2. තමන්ට කරදරයක් සිදු වූ බවය.
3. පිහිටක් පතා ගිය තැනින් විපතක් සිදු වූ බවය. 4. තම බලාපොරොත්තුව බිඳ වැටුණු බවය.

02) සේවකයන්ගේ විලාසය <u>අතු කඩා මොර කන්නා සේ</u> යැයි හේ පැවසුවේ බලවත් සිත් වේදනාවෙනි.
1. මොර කෑම නිසා පාඩු වූ බවය. 2. මොර කෑමට අතු කැඩිය යුතු බවය.
3. තමන්ට හොඳ අය මාර්ගයක් ලැබෙන බවය. 4. අය මාර්ග මුළුමනින්ම විනාශ කර දමන බවය.

03) පියාගෙන් තම පුතුට නිතර ලැබුණු ඔවදන වූයේ <u>කඩුල්ලේ තරමට කද</u> බඳිනු යන්නයි.
1. පමණ දැන කටයුතු කරන්න කියා ය. 2. අවස්ථාවට සුදුසු දෙයක් කිරීමයි
3. දක්ෂයින්ට තැනක් ලැබෙන බවයි. 4. මෝඩකම් නොකළ යුතු බවයි.

- අංක 04-06 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.

04) විවිධ සාහිත්‍ය සම්බන්ධ ලියැවුණු පොත පත, විචාර ග්‍රන්ථ ......................... කිරීමෙන් ඔබට ද සාර්ථක නිර්මාණකරුවෙකු විය හැකිය.
1. අභ්‍යාස 2. පරිශීලනය 3. ප්‍රකාශනය 4. ආභාසය

05) සිංහල භාෂාව හා බෞද්ධ සංස්කෘතිය අතර ඇත්තේ ...................... සම්බන්ධතාවකි.
1. අර්ථාන්විත 2. ඖචිත්‍ය 3. අවියෝජනීය 4. විස්මිත

06) ඉංග්‍රීසි ප්‍රමුඛ ජර්මන්, ප්‍රංශ යන ................ භාෂා පිළිබඳව ද බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමියන් ලද ප්‍රවීණත්වය අතිමහත්ය.
1) ප්‍රාචීන 2. ප්‍රතිචීන 3. ව්‍යාඛ්‍යාන 4. ස්වදේශීය

07) ආකාරාදි පිළිවෙළ නිවරැදිව දක්වෙන පද පේළිය තෝරන්න.
1. කැප්පෙටිපොළ, කැකුණදුර, කිරිඔරුව, කහටරුප්ප
2. සුභාෂිතය, ගුත්තිල කාව්‍යය, කාව්‍යශේඛරය, සිරිත් මල්දම
3. කළුගඟ, කලා ඔය, මහ ඔය, මහවැලි ගඟ
4. බාසිලෝනා, බැංකොක්, බීජිං, බූලවාලි

08.) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරැදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. මහලු, සියලු, කුරුලු, වළලු, 2. අරමුන, ප්‍රවීණ, සංක්‍රමණ, ග්‍රහනය
3. ඇතුළත, ඇතුළුවීම, තුළ , පළල 4. ප්‍රශ්ණ, දර්ශන, ප්‍රකාශන, විමර්ෂන

09) එක් එක් වචනවල මුලකුරෙහි ඇදය, පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
1. ගිරය, මාල, රුවන්, නුවණ 2. පැය, කුඩය, නියර, වාසල
32. හැන්ද, කුඹල්, මාර, දිනය 4. වැලි, පුවක්, දෙමට, කැටය

10) ''අකුසල්'' යන වචනය අයත් වන්නේ,
1. විශේෂණ සමාසය 2. විභක්ති සමාස ය 3. අව්‍ය සමාස ය 4. අන්‍යාර්ථ සමාස ය

11) ''වඳුරාට'' යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කළ විට නිවැරදි ව දක්වෙන්නේ,
1. වදුර් + ආට 2. වඳු + රාට අ 3. වඳුරු + ට 4. වඳුරු + ආට

12) මල්ලී පෑනෙන් අකුරු ලියයි. යන වාක්‍යයේ පෑනෙන් යන පදය අයත් වන විභක්තිය වන්නේ,
1. කරණ විභක්තිය 2. සම්ප්‍රදාන විභක්තිය 3. ආධාර විභක්තිය 4. අවධි විභක්තිය

13) අන්තස්ථ අක්ෂර පමණක් යෙදී ඇති වරණය වන්නේ,
1. ක, ච, ට, ත, ව 2. ප, බ, ම, ද 3. ස, ශ, ෂ, හ 4. ය, ර, ල, ව

- අංක 14 - 16 තෙක් ප්‍රශ්නවල ඉරි ඇඳි පදවල අර්ථය නිවැරදි ව දක්වෙන වරණය තෝරන්න.

14) අපේ ඉතිහාසය රසවත් <u>වෘත්තාන්තයක්</u> ලෙස ද උගත හැකිය.
1. මාතෘකාවක් 2. කතාවක් 3. ග්‍රන්ථයක් 4. අවස්ථාවක්

15) සිංහල ගීතය <u>යථාර්ථවත්</u> සාහිත්‍ය භාෂණයක් බවට අද පත් ව ඇත්තේ ය.
1. උසස් 2. සැබෑ අරුතකින් යුත් 3. මනා සේ තියුණු 4. අර්ථයට ගැලපෙන

16) ඌතුමූ <u>අටසාළිස්</u> ගව්වක් පමණ මහ මගට පිවිසියේ දෙව්රම් වෙහෙර බලන්ට යාමේ අදහසිණි.
1. දහසය 2. හතළිස් දෙක 3. හතළිස් අට 4. පනස් දෙක

17) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් නොවන, පදයක් සහිත පිළිතුර තෝරන්න.
1. තද්ධිත - ධනවත්, ස්වර්ණමය, නාගරික, නිර්මල 2. කෘදන්ත - කියුම්, කැපිලි, ලියන්න, දුවන
3. නිපාත - තෙක්, විතර, ඉක්බිති, මිස 4. උපසර්ග - සුදන, නීරස, පබඳ, අකල්

18) පරස්වර ලෝප සන්ධියට උදාහරණයක් නොවන පදය තෝරන්න.
1. මිණිබරණ 2. දියති 3. සියැසින් 4. සුරඟන

19) මුලින් දී ඇති පදයට සමානාර්ථ නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
1. හිරු - දිනකර, දිවයුරු, දිනිඳු, රිවි 2. ගජ - වරුණ, හස්ති, සකි, ඇත්
3. ගගන - නුඹ, ගුවන, අහස, ආකාසය 4. කැලෑව - වල, අරණ, ලන්ද, රුකුල

20) විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන වර්ණය තෝරන්න.
1. අනාචාර - ආචාර 2. නිරාකුල - ආකුල 3. මනාප - අමනාප 4. සාමූහික - පොදු

21) පූර්ව ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.
1. ගායිකා ගී ගයද්දී ප්‍රේක්ෂකයෝ ඔල්වරසන් දුන්හ. 2. මම ලිපිය කියවා නිදා ගත්තෙමි.
3. නංගී නටමින් සිනාසුණාහ. 4. ස්වාමියා සේවකයා ලවා ගෙබිම පිරිසිදු කරවයි.

22) වැරදි අදහස සහිත වාක්‍ය තෝරන්න.
1. මූර්ධජ (ෂ) කාරයට පරව (න) යෙදේ
2. (කී) අක්ෂරයේ පිල්ලම් සඳහා (ඊ) ස්වරය නියෝජනය වේ.
3. රකාරාංශයට පරව (ය) යංශය නොයෙදේ.
4. ගී ගයද්දී යනු අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි.

23) ''බැලූහ'' යන ක්‍රියා පදය,
1. ප්‍රථම පුරුෂ වර්තමාන කාල බහු වචන ක්‍රියා පදයකි.
2. ප්‍රථම පුරුෂ අතීත කාල බහු වචන ක්‍රියා පදයකි.
3.මධ්‍යම පුරුෂ අතීත කාල බහු වචන ක්‍රියා පදයකි.
4. මධ්‍යම පුරුෂ වර්තමාන කාල ක්‍රියා පදයකි.

- අංක 24 - 26 තෙක් ඇති ප්‍රස්ථාව පිරුළු වලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

24) කළුවා මාරපන් ගියා වගේ,
1. ප්‍රයෝජනයක් නැති දෙයක් කිරීම
2. නුගත් දෙයක් කිරීම
3. අවබෝධයකින් තොරව වැඩ කිරීම
4. කරදරයකින් තවත් කරදරයකට පත්වීම

25) ජාඩියට මූඩිය වගේ,
1. අවදානම් වැඩක් කිරීම
2. සුදුසු නොවන දෙයක් කිරීම
3. සමාන අදහස් දැරීම
4. තැනට සුදුසු දෙයක් කිරීම

26) හිල් කූඩෙන් වතුර අදිනවා වාගේ
1. යම් දෙයකට කිසියම් උත්සාහයක් ගැනීම
2. උත්සාහයක් මගින් ජයක් ලැබීම
3.යම් කාර්යයක් සිතා බලා කිරීම
4. නිෂ්ඵල දෙයක් සඳහා මහන්සි වීම

- අංක 27 සිට 29 තෙක් ප්‍රශ්න වල ව්‍යාකරණානුකූලව නිවැරැදි වාක්‍ය තෝරන්න.

27) 1. අපි යහපත් ළමයින් සේ හැසිරෙමු
2. අපි යහපත් ළමයි සේ හැසිරෙමු
3. අප යහපත් ළමයින් සේ හැසිරෙමු
4. අප යහපත් ළමයි සේ හැසිරෙමු

28) 1. මා ගමට යති යි දෙමාපියන් සිතති
2. මා ගමට යති යි දෙමාපියෝ සිතති
3. මම ගමට යතියි දෙමාපියෝ සිතති
4. මා ගමට යමි යි දෙමාපියන් සිතති

29) 1. සභා තොමෝ සතුටින් විසිර ගියහ
2. සභා තොමෝ සතුටින් විසිර ගියාය
3. සභා තොමෝ සතුටින් විසිර ගියෝය
4. සභා තොමෝ සතුටින් විසිර ගියෝය

30) අර්ථයෙන් සමානවත් ව යෙදී ඇති යුගල පදය සහිත වරණය තෝරන්න.
1. බාල - මහලු
2. අස් - පස්
3. ගරු - නම්බු
4. කන - කර

31) පද්‍ය පාදයන්හි කෙළවර හෝ කීප තැනක සමාන අකුරකින් කෙළවර වන අයුරින් පද යෙදීම හඳුන්වන්නේ,
1. අනුප්‍රාසය යි
2. උත්ප්‍රාසය යි
3. ධ්වනිතාර්ථය යි
4. එළිසමය යි

32) රූපකයක් සහිත වරණය තෝරන්න.
1. දුනුකෙයියා මලක් වගේ දුරට පේනවා
2. පසළොස්වක සඳ පායනු වැන්නේ
3. සඳ කිඳුරකු ලෙසිනා එන සඳ ඔබේ රුව මට පෙනුනා
4. කලා වැවේ නිල් දියවර අපේ අම්මා

- 33 සහ 34 ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

33) වැව මුල් කරගෙන ගොඩනැගුණු ගම්මාන ද, විහාරස්ථාන ද නිසා ලාංකිකයා තුළ යහපත් සංස්කෘතිකාංග ද උතුම් ආචාර ධර්ම ද ගොඩ නැගුණි.
1. ලාංකිකයා තුළ යහපත් සංස්කෘතිකාංග හා ආචාර ධර්ම ගොඩනැගුණේ වැව මුල් වී ගොඩ නැගුණු ගම්මාන හා විහාරස්ථාන නිසාය.
2. ආචාර ධර්ම ගම්මාන වලිනුත් විහාරස්ථාන නිසා සංස්කෘතියක් අතීතයේ ගොඩ නැගුණි.
3. සංස්කෘතිය හා ආචාර ධර්ම ගොඩ නැගුණේ වැව හා විහාරස්ථානය නිසාය.
4. ලාංකික වැව නිසා උතුම් ආචාර ධර්ම හා සංස්කෘතිය ගොඩ නගා ගත්තේය.

34) හින්දූන්ගේ ප්‍රධාන දෙවඟනක් වන ශ්‍රී ලක්ෂ්මීය බොහෝ විට පෙනී සිටින්නී අතින් දරා ගත් නෙළුමක් සහිතව හෝ නෙළුම් මලක් මත වැඩ හිඳිනා ස්වරූපයෙනි. එබැවින් ඇය දීපවාලී උත්සවයෙහි ඉතා වැදගත් දෙවඟන වන්නීය.
1. දීපවාලී උත්සවයේ දී නෙළුම් මල් අතින් දරා ගෙන හෝ ඒ මත වැඩ හිඳිනා දෙවඟනක් සිටිය යුතුයි.
2. අතින් දරා ගත් නෙළුමක් සහිතව හෝ නෙළුම මත වැඩ හිඳිනා ස්වරූපයෙන් සිටින ශ්‍රී ලක්ෂමී දෙවඟන දීපවාලී උත්සවයේ ප්‍රධාන දෙවඟනයි.
3. හින්දූන්ගේ ප්‍රධාන දෙවඟන ලෙස දීපවාලී උත්සවයේ දී ශ්‍රී ලක්ෂමීය වැදගත් නොවේ.
4. දීපවාලී උත්සවයේ දී නෙළුම් මල් ශ්‍රී ලක්ෂමී දෙවඟනට පූජා කිරීම සිදු වේ.

35) ''ඉහළ වෙලේ ඉස්මත්තේ
දිය හබරල මල් ගොල්ලේ
නීල වරල ළැමැද හෙලාලා
පලා නෙළන්නේ
නීල නුවන් දෑල වරින්
වැස්ස වහින්නේ ''
''කෙකටිය මල්'' පද්‍යයෙහි වූ ඉහත කාව්‍ය කොටස ඇතුළත් සක්වාලිහිණි කෘතිය රචනා කරන ලද්දේ,
1. පරාක්‍රම කොඩිතුවක්කු මහතා 2. මහගමසේකර මහතා
3. රුවන් බන්දුජීව මහතා 4. නන්දන වීරසිංහ මහතා

36) පහත සඳහන් කවියේ දෙවන පදය දී ඇති වරණ අතුරින් තෝරන්න.
කුදේ ගැසී නැගිටින කල වෙවුලා
.........................................................................
සොදේ විදින සැප විදුමට මෙකලා
ලදේ නිසරු නොකරන් අප සියලා
1. ඉසකේ පුපුරුටි දත් කඩ තොල්ලා 2. පූන නූල ඇද දමමින් බිඳලා
3. කදේ කැසිත් කැස පට අකලා 4. බාන ලෙසට අල්ලා ගෙන රවුළා

37) කප් සිටුවා පස්වන දිනයේ සිවු දේවාලයේ බස්නායක නිලමේවරුන් ඇතුළු නිලධාරීහු රන්සිළු ගෙයක රන් ආයුධ හිඳුවා රන්සිළු ගෙය ඇතු පිට තබා පෙරහැරින් අවුත් දළදා මාළිගාව ඉදිරිපිට දේව සංහිඳ දී දළදා කරඬුව සහිත රන්සිවි ගෙය වැඩමවන, මාළිගාවේ ඇතා ප්‍රමුඛ ව පෙරහැර පෙරටුකර ගෙන පස් දිනක් විථි සංචාරය කරන දළදා පෙරහැර හැඳින්වෙන්නේ,
1. කුඹල් පෙරහැර ලෙසිනි 2. දේවාල පෙරහැර ලෙසිනි
3. රන්දෝලි පෙරහැර ලෙසිනි 4. දවල් පෙරහැර ලෙසිනි

38) පහත සඳහන් පද්‍ය කොටසේ අර්ථය නිවැරැදිව දැක්වෙන වරණය තෝරන්න.
''හැම ගනඳුරු බොන වර නිසයුරා ගත
පහන් බැවින් පිටතට සස ලෙසින් වත''
1. චන්ද්‍රයා ගනඳුර උරා බොන විට සස ලපයක් සේ නොපෙනේ.
2. චන්ද්‍රයා ගනඳුර උරා බොන විට ප්‍රසන්න සිරුර නිසා සස ලප ආකාරයෙන් පිටතට පැමිණේ.
3. සස ලපයක් සේ ගනඳුර උරා බොන විට චන්ද්‍රයා දීප්තිමත්ව දිස්වේ.
4. ප්‍රසන්න චන්ද්‍රයා නිසා සස ලපයක් සේ ගනඳුර උරා බී පිටතට පැමිණේ.

39) තල බල පිපිලා නාටකය ලියන ලද්දේ,
1. හෙන්රි ජයසේන මහතා ය 2. දයානන්ද ගුණවර්ධන මහතා ය
3. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය 4. ජයලත් මනෝරත්න මහතා ය

40) පයින් ගොයම් පාගන විට එළන පැදුර සඳහා කමත් භාෂා ව්‍යවහාරයේ දී හඳුන්වන්නේ,
1. කුටාලම 2. මාගල 3. යතුර 4. බෙර අත්ත

II කොටස

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
★ මෙම කොටසට නියමිත ලකුණු ගණන 80 කි.

---

01) (I) සිට (X) තෙක් ඇති සියලුම අනුකොටස් වලට කෙටි පිළිතුරු ලියන්න.
කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I) පහත පදවල නිවැරදි අර්ථය ප්‍රකාශ වන පරිදි අර්ථවත් වාක්‍ය දෙකක් ලියන්න.
(අ) සරන (ආ) සරණ

II) (අ) සන්ධ්‍යක්ෂර දෙකක් ලියා දක්වන්න.
(ආ) අර්ධ අනුනාසික්‍ය අක්ෂර දෙකක් ලියා දක්වන්න.

III) පහත අක්ෂර කාණ්ඩවල උත්පත්ති ස්ථාන නම් කරන්න.
(අ) ප, එ, බ, භ, ම (ආ) ක, ඛ, ග, ඝ, ඩ

IV) පහක වාක්‍යයෙහි පද දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම පද දෙක පමණක් නිදොස් කර ලියන්න.
ආයතන ප්‍රධානියා කණිෂ්ට සේවකයින්ට දැනුම් දෙනු ලැබුවේ සියලු දෙනා පරිසනක දැනුම ලබාගත යුතු බවයි.

V) පහත නාම පදවල ප්‍රකෘතිය සහ ප්‍රත්‍ය වෙන්කර ලියන්න.
(අ) තරුණයන් (ආ) උදැල්ලෙන්

VI) පහත ප්‍රකෘති ප්‍රත්‍යය එක් වූ විට සෑදෙන තද්ධිත නාම ලියා දක්වන්න.
(අ) නිපුන + ය (ආ) පුරාණ + ඉක

VII) පහත වාක්‍යවල ඉරි ඇඳි පද අයත් විභක්ති නම් කරන්න.
(අ) <u>සාමාජිකයෝ</u> සියල්ලෝම යෝජනාවට පක්ෂව ඡන්දය දුන්හ.
(ආ) පියල් <u>විභාගයෙන්</u> සමත්ව කොළඹ රැකියාවට ගියේය.

VIII) පහත වාක්‍යවල ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ විධි ලියන්න.
(අ) නැත අන් පිහිටක් ඔබ <u>හැර</u> මෙමටා
(ආ) එම චෝදනාවෙන් ඔහු <u>නිදොස්</u> විය.

IX) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයටත් කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවා ලියන්න.
(අ) ළමයි උද්‍යෝගයෙන් චාරිකාව සංවිධානය කරති.
(ආ) උවසුවන් විසින් පෙහෙවස් සමාදන් වන ලදි.

X) පහත සඳහන් වාක්‍ය සදොස් වේ නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) තැන තැන පියුම් පොකුණු වූහ.
(ආ) අප විද්‍යාලයේ දක්ෂ සිසුන් ඇත. (ලකු. 2 × 10 = 20)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඇ), (ඈ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. (ලකු. 25)

(අ) මිනිසා විසින් කරනු ලබන විවිධ සංවර්ධන කාර්යයන් හේතුවෙන් වන ගහනය අඩුවීම ස්වාභාවික ව්‍යසන බහුලවීම, ඇළ මං අවහිරවීම, වගුරුබිම් ගොඩවීම, කඳුකර ප්‍රදේශ අහස් දියට නිරාවරණය වීම ආදී විවිධ හේතු නිසා ගංවතුර, නායයෑම, ආදි ස්වාභාවික ව්‍යසන බහුල වෙමින් පවතී. එම විපත් අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරමින් රචනාවක් ලියන්න.

(ආ) ජනමාධ්‍යයන්හි රිය අනතුරක් ගැන සඳහන් නොවන දිනයක් සොයා ගැනීමට නොහැකි තරමට ම වර්තමානයේ රිය අනතුරු බහුල වී ඇත. එම හේතුවෙන් විශේෂයෙන්ම තරුණ ජීවිත විශාල සංඛ්‍යාවක් රටට අහිමි වී ඇති අතර අංග විකලත්වයට පත්වන පිරිස ද අති විශාල ය. දිනපතා සිදුවන මෙම රිය අනතුරුවලට හේතු හා ඒවා අවම කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ප්‍රමුඛතම කාර්යයක් සේ සලකා ක්‍රියා කළ යුතුය.

(ඇ) විවිධ පිළිකා ජනනය කිරීමේ මූලකාරකයක් වීම, ගිනිතැබී මෙන් වායු දූෂණය ඉහළ යාම, දිරා නොයන ද්‍රව්‍ය නිසා පාංශු දූෂණය වීම වැනි පාරිසරික හා සමාජ ගැටලු රාශියක් නිර්මාණය වීමට මූලාශ්‍ර වී ඇත්තේ පොලිතීන් භාවිතයයි. විවිධ උත්සව අවස්ථා, ආහාර ද්‍රව්‍ය රැගෙන යෑම ඇතුළු නූතන සමාජ ක්‍රියාකාරකම් වලට පොලිතීන් නැතිවම බැරි අංගයක් බවට පත්ව ඇත. එහෙත් පොලිතීන් නිෂ්පාදනය හා භාවිතය තහනම් කිරිම කාලෝචිත වැදගත් තීරණයකි.

(ඇ) ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම නූතන සමාජය නව ප්‍රවණතාවයක් සේ ඉස්මතුවෙමින් පවතී. මල් කැකුළුවන් දරුවන් විවිධ අපයෝජන වලට ලක් කොට මරා දැමීමේ පුවත් නිතර අසන්නට ලැබේ. මෙකී ඛේදජනක තත්වය නතර කිරිමට දෙමව්පියන් හා දරුවන් දැනුවත් කිරීම හා එවැනි අපරාධ කරුවන්ට ඉක්මනින් නීතිය ක්‍රියාත්මක කොට දඬුවම් ලබාදීම කාලීන අවශ්‍යතාවයකි.

03. පහත දැක්වෙන පාඨය වචන 55 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

දකුණු ආසියා කලාපයේ රටවල් අතුරින් ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම දෙවැනි වන්නේ මාලදිවයිනට පමණය. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින ආර්ථික ශක්තියෙන් අඩු රටක් වුව ද වාර්ෂිකව සිය දළ ජාතික ආදායමෙන් සියට හතරකටත් වැඩි ප්‍රමාණයක් අධ්‍යාපනය සඳහා වැය කරයි. එම නිසා අපේ රටේ සාක්ෂරතාව සියයට 92.5 ක් තරම් ඉහළ මට්ටමක පවතින බව අතිශයෝක්තියක් නොවේ. කලාපයේ පකිස්තානය, නේපාලය, බංගලාදේශය හා භූතානය වැනි රටවල් සමඟ සසඳන විට එය ඉහළ මට්ටමකි. සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සාක්ෂරතා මට්ටම දකුණු ආසියානු කලාපීය රටවල් අතුරින් ඉහළ මට්ටමක පැවතිය ද රට තුළ අධ්‍යාපන පහසුකම් ව්‍යාප්ත වීමේ ඇති විෂමතාව නිසා ප්‍රදේශ හා පළාත් අනුව සාක්ෂරතා මට්ටම් වල වෙනස්කම් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය පාසල්, විශ්වවිද්‍යාල වැඩිම ප්‍රමාණයක් පිහිටා ඇත්තේ බස්නාහිර පළාත තුළය. එහෙත් අනෙකුත් පළාත්වලට වඩා බස්නාහිර පළාතේ සාක්ෂරතා මට්ටම ඉහළ ය. පවුල් වල ආර්ථික ශක්තිය සාක්ෂරතා මට්ටම් වල වෙනස්කම් ඇති කිරිමට බලපා ඇත. වැඩි ආර්ථික ශක්තියක් ඇති පවුල්වල අයට ජනප්‍රිය පාසල් තුළින් වැඩි පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව නිසා අඩු ආදායම් ඇති අයගේ දරුවන්ට වඩා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට අවස්ථාව සැලසී ඇත. මින් පැහැදිලි වන්නේ පවුල් වල ආර්ථික ශක්තිය සාක්ෂරතා මට්ටම් වල විවිධත්වයක් ඇති කිරිම කෙරෙහි බලපා ඇති බවයි.

(ලකු. 10)

04. පහත සඳහන් ගද්‍ය පාඨය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.

කිසියම් සාහිත්‍ය කෘතියක් සාර්ථක වීමට නම් එහි රසය හා උපයෝගීතාව යන අංශ දෙක කෘතිය තුළ වෙන් වෙන්ව තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඒවා සුසංයෝගී ව තිබිය යුතුය. සාහිත්‍ය රසය යනු අප විඳීමට පුරුදු නිශ්චිත රස ගණනාවකින් එකක් නොව උත්තරීතර රසයකි. මක් නිසා ද යත් '' උත්තරීතර රසය''ලැබෙනුයේ විශිෂ්ට කාර්යයක් වන නිරාමිස චිත්ත සමාධිය මගින් බැවිනි. එමෙන්ම සාහිත්‍යය කෘතියක උපයෝගීතාව එනම් එහි උපදේශාත්මක ගාම්භීර්යය රසාත්මක වූ ගාම්භීර්යයක් විය යුතුය. එය කෙනෙකු විසින් දුෂ්කර බන්ධන වලට ඇබ්බැහි වූවන්ට සාහිත්‍යය කෘතියක ඇති සෞන්දර්යාස්වාදය පිළිබඳ ව දුෂ්කර බන්ධන වලට ඇබ්බැහි වූවන්ට සාහිත්‍යය කෘතියක ඇති අගය එහි ඇති උපදේශ හෝ ඓතිහාසික තොරතුරු වලට සීමා කළ හැක.

1) මෙහි සඳහන් පරිදි සාහිත්‍යය කෘතියක පැවතිය යුතු ප්‍රධාන අංග කවරේ ද?
2) සාහිත්‍යය කෘතියක උපදේශ අඩංගු නොවිය යුතු යැයි මෙම පාඨයෙන් හැඟේද?
3) මෙම පාඨයට අනුව සාහිත්‍ය රසය උත්තරීතර වනුයේ කවර හෙයින්ද?
4) ''නිරාමිස චිත්ත සමාධිය'' යන්න පැහැදිලි කරන්න.
5) දුෂ්කර බන්ධන සොයන්නන්ගේ සහ අධ්‍යාපනඥයන්ගේ කාර්යයන් සාහිත්‍ය රසාස්වාදයෙන් පරිබාහිර බවක් මෙයින් හැඟවේද? (ලකු.2 × 5 = 10)

05. ඔබ පිරිවෙණේ කෘෂිකර්ම සංගමය මගින් වගා ව්‍යාපෘතියක් ඇරඹීමට තීරණය කර ඇත. එම සංගමයේ ලේකම් ඔබයැයි සිතා පිරිවෙන් අවට භූමියේ වගා කිරීමට සුදුසු බීජ වර්ග ද ඒවා වගා කිරීමට අවශ්‍ය උපදෙස් ද ලබාදෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරිතුමා වෙත යවන ලිපිය ලියන්න.

( වචන 100 ක් පමණ සෑහේ )

නැතහොත්

කසළ කළමනාකරණය ජනතාව අතර වහ වහා ව්‍යාප්ත කළයුතු ජාතික සේවාවකි. ඔබ ප්‍රදේශයේ ශරීර සුවතා සම්පාදන කමිටුවේ ලේකම්වරයා ඔබ යැයි සිතා මේ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිණිස අත් පත්‍රිකාවක් සකසන්න. කසළ කළමනාකරණයේ අවශ්‍යතාව, අනිසි භාවිතය වලක්වා ගැනීමට යෙදිය යුතු උපාය මාර්ග, නැතහොත් සිදුවන හානි ආදි කරුණු ඔබ සකසන අත් පත්‍රිකාවෙහි අන්තර්ගත විය යුතුය.

(වචන 100ක් පමණ සෑහේ )

(ලකුණු 15)

| |
|---|
| **මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2019**<br>**Primary piriven first End Test – 2019**<br>**5 වසර – Grade 5**<br>**සිංහල – III** **කාලය : පැය 03 යි**<br>**Sinhala – III** **Time : Three hours** |

- ★ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ★ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- ★ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

01) (I) සිට (X) තෙක් ඇති සියලුම අනුකොටස් වලට කෙටි පිළිතුරු ලියන්න.
කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

I) (අ) බැද්දේගම නව කතාවේ මුල් රචකයා නම් කරන්න.
(ආ) බැද්දේගම නව කතාවේ අනුවර්තකයා නම් කරන්න.

II) (අ) සැළලිහිණි සංදේශයේ කතුවරයා නම් කරන්න.
(ආ) එතුමන් විසින් රචිත වෙනත් සංදේශ කාව්‍යයක නම ලියන්න.

III) (අ) සද්ධර්මරත්නාවලිය රචිත යුගය කුමක්ද?
(ආ) සද්ධර්මරත්නාවලිය රචිත කතුවරයා නම් කරන්න.

IV) (අ) සිංහල කවීන්ට පද්‍ය නිර්මාණ පිළිබඳ උපදෙස් ලබාදෙන මුල්ම ග්‍රන්ථය කුමක්ද?
(ආ) එම ග්‍රන්ථය රචිත කතුවරයා නම් කරන්න.

V) (අ) සද්ධර්මාලංකාරය රචනා වූයේ කිනම් යුගයක ද?
(ආ) සද්ධර්මාලංකාරය රචිත කතුවරයා නම් කරන්න.

VI) (අ) කොළඹ යුගයේ මුල් පරපුරේ කවීන් දෙදෙනෙකු නම් කරන්න.
(ආ) කොළඹ යුගයේ දෙවන පරපුරේ කවීන් දෙදෙනෙකු නම් කරන්න.

VII) "මම වෙන කිසිම ගෑනියෙක් ගන්නේ නැහැ මං කැමති ඈට, ඈ ලස්සනයි "
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙහි 'ඈ 'යනුවෙන් හඳුන්වනුයේ කවුරුන්ද?

VIII) "බුදුන් වදාළ බස මඟුලෙන් හෙළා ලූ කප උගුලවන්ට බැරියා සේ උගුළුවා ලන්නට බැරි හෙයින් මහණ නොවෙමි. "
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් කතා වස්තුව නම් කරන්න.
(ආ) එම කතා වස්තුව ඇතුළත් මුල් ග්‍රන්ථය නම් කරන්න.

IX) (අ) පන්සිය පනස් ජාතක පොත රචනය සඳහා පාදක වූ මුල් ග්‍රන්ථය නම් කරන්න.
(ආ) පන්සිය පනස් ජාතක පොත රචනා වූ යුගය නම් කරන්න.

X) (අ) සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය කුමක්ද?
(ආ) එම යුගයේ වඩාත් වැදගත් රාජ්‍ය පාලකයා නම් කරන්න. (ලකු. 2×10 = 20)

02. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I) සිසි වන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින
නිසි පුළුලුකුල රිය සක යුරු තිසර තන
දිසි රනලියෙව් රුසිරෙන් යුත් මෙ පුර ගන
ඇසිපිය හෙළන පමණින් නොවෙති දෙව ගන

අ) මෙම පද්‍යයේ ඇතුළත් උපමාලංකාරයක් ලියා දක්වන්න.
ආ) මෙම පද්‍යයේ ඇතුළත් රූපකාලංකාරයක් ලියා දක්වන්න.

II) "ඕ තොමෝ දරුගැබ් මුහුකුරා ගිය කල්හි වල්ලභයා හා සමග කථා කරන්නී දරුගැබ මුහුකුරා ගියේය. ඥාති බන්ධූන් නැති තෙන දී දරු වැදීම නම් අප දෙදෙනාටම දුක් වන්නේය.
අ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.
ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

III) කොඳ වන් මහ ද ඔඳ කළ මඳ මඳ හසි නි
සුපසන් නුඹේ උවන දකුමට නැති බැවි නි
එ උවන් සම තරිඳු සොමි වුත් පෙර පවි නි
සැබැවින් සඳ ද දස මසකින් ම නොපෙනු ණි
අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.
ආ) 'කොඳ වන් මහ ද ' යන්නෙහි අලංකාර විධිය ලියන්න.

IV) "එමහගම් නුවර සමීපයෙහි කරන ලද රජ මහා විහාර මධ්‍යයෙහි ඇති ධවල වූ මහා ප්‍රාකාරයෙන් පරික්ෂෙප කරන ලද මුතු රැසක් හා සමාන සුදුවැලි තලාවෙන්ය.
අ) මෙම පාඨය ඇතුළත් කතා වස්තුව නම් කරන්න.
ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අරුත් ලියන්න.

V) "බැහැපිය බල්ල මගෙ ගෙයින් එළියට, මගෙ ගෙදර හරියට කිසිම ගැනියෙක් ගේන්ඩ තොට ඉඩ දෙන්නේ නෑ. "
අ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.
ආ) මෙම ප්‍රකාශකයාගේ බිරිඳගේ නම ලියන්න. (ලකු. 4 × 5 = 20)

03. බැද්දේගම නව කතාව තුළින්
I) ග්‍රාමීය මිනිසුන්ගේ සිරිත් විරිත් හා
II) දුප්පත් අසරණ දිවි පැවැත්ම මැනවින් ඉස්මතුවේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න. ( ල. 15 )

නැතහොත්

ශ්‍රී ලංකිකයා තුළ
I) දේශානුරාගයක් ඇති කිරීම
II) නිදහස් සටනට මෙහෙයවීම යන අරමුණු සහිතව එස්. මහින්ද හිමියන්ගේ පද්‍ය නිර්මාණ බිහි විය. නිර්දිෂ්ට පද්‍ය පන්ති ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.
ල. 15 )

04. ධර්මසේන හිමියන්ගේ කතා කලාවේ සුවිශේෂීත්වය
I) උපමා උපමේය භාවිතය
II) අවස්ථා හා සිද්ධි නිරූපණය යන කරුණු තුළින් විදහා දක්වෙන ආකාරය නන්ද මහා තෙරුන් වහන්සේගේ වස්තුව ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

නැතහොත්

සැළලිහිණි සංදේශය ප්‍රශස්ත කාව්‍යයක් වන්නේ
1 කතුවරයා සතු ප්‍රතිභා ශක්තිය හා
II) පද සංඝටනාවේ අපූර්වත්වය නිසාවේ.
එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න. ( ල. 15 )

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.

5. ජාතක කතා තුළින් මිනිස් දිවියට අවශ්‍ය ධර්මාවබෝධය මෙන්ම ජීවතාවබෝධය ද ලබාදෙන අයුරු නිර්දිෂ්ට කොටසින් නිදසුන් තුනක්වත් දෙමින් විමසන්න. ( ල. 10 )

6. කොළඹ යුගයේ කවීන්ගේ පද්‍ය නිර්මාණ වඩාත් ජනප්‍රිය වීමට හේතු වූයේ සාම්ප්‍රදායික කවි මගෙන් බැහැර වීමයි. නිර්දිෂ්ට පද්‍ය පන්ති ඇසුරෙන් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න.
( ල. 10 )

07. ශ්‍රාවකයාට දහම් අවබෝධයෙන් ජීවිත සුඛිත මුදිත කරගැනීමට මග කියාදෙන ධර්ම ග්‍රන්ථයක් ලෙස සද්ධර්මාලංකාරය හැඳින්විය හැකිය. නිර්දිෂ්ට කතා ඇසුරෙන් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.
( ල. 10 )